
# ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය



සංගණනයට අදාළ සියලුම ලිපි ලේඛන හා පොත්පත් මුද්‍රණය කෙරෙන්නේ මෙම මුද්‍රණ අංශයෙනි.

මේ දිනවල මේ වසරේ ජූලි මස 17 වැනිදා පැවැත්වෙන අවසාන ජන හා නිවාස සංගණනය පිළිබඳ පුළුල් ප්‍රචාරය නිසා සමහරවිට කෙනෙකු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන එකම කාර්යය මෙය විය හැකි යැයි සිතනු ඇත.

සැබැවින් ම එය එසේ නොවේ. වසර දහයකට වරක් සාමාන්‍යයෙන් සිදු කෙරෙන මෙම ජන හා නිවාස සංගණනය පමණක් නොව ඊට වඩා ඉතා විශාල පුළුල් වූ සංඛ්‍යාන දත්ත හා සම්බන්ධ වූ සේවාවන් රැසක් ම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බව අප මෙහිදී පළමුව සඳහන් කළ යුතුව ඇත. ඒ අතරේ ජන හා නිවාස සංගණනය විශේෂිත වූ සමස්ත ජනතාවගේම පූර්ණ සහයෙන් ඉටු වන කාර්යයක් බව මෙහිදී අවධාරණය කළ යුතුව ඇත.

*මෙරට සමාජ ආර්ථික තත්ත්වයන් හා අදාළ දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රචාරය කිරීමේ වගකීම පැවරී ඇත්තේ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යි. ජාතික සැලසුම්කරණයට සහ රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම මෙන්ම එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගැයීම සඳහා අවශ්‍ය දත්ත සැපයීම මෙම දෙපාර්තමේන්තුව මගින් නොකඩවා සිදු කෙරෙයි.*

සාමාන්‍යයෙන් මෙම දෙපාර්තමේන්තුව හඳුන්වාදී ඇති අන්දම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ ජනරාල් ඒ. ජී. ඩබ්ලිව්. නානායක්කාර මහතා විසින් 1999 වර්ෂය සඳහා නිකුත් කරන ලද පාලන වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත.

මෙරට සමාජ ආර්ථික තත්ත්වයන් හා අදාළ දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රචාරය කිරීමේ වගකීම පැවරී ඇත්තේ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යි. ජාතික සැලසුම්කරණයට සහ රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම මෙන්ම එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගැයීම සඳහා අවශ්‍ය දත්ත සැපයීම මෙම දෙපාර්තමේන්තුව මගින් නොකඩවා සිදු කෙරෙයි. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ ඇතුළු විවිධ මාර්ගවලින් ලබා ගන්නා ලද දත්ත ඇසුරින් නොයෙක් විෂයයන් අළලා නොකඩවා දත්ත සැපයීමෙන් දේශීය මෙන්ම විදේශීය සංවිධාන අවශ්‍යතාද සපුරාලයි. සමහර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි පවත්වාගෙන යන ශාඛා කාර්යාල මගින්ද ඉටු කෙරෙන වඩා වැදගත් කටයුතු සමහරක සංක්ෂිප්ත විස්තරයක් ද පාලන මාර්ගවලට ඇතුළත් කරනු ඇත. දෙපාර්තමේන්තුව විසින් රැස් කරන දත්ත (Data) ජනගහනය, කෘෂිකර්මය, වෙළඳාම, කර්මාන්ත මිල ගණන් හා ජාතික ආදායම් ආදී ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරයි.



අධ්‍යක්ෂ ජනරාල් හා සංගණන අධිකාරි විමල් නානායක්කාර මහතා සංගණනය පිළිබඳ සිය නිලධාරීන් කිප දෙනකු සමග සාකච්ඡාවක

සාමාන්‍යයෙන් මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබන සංඛ්‍යාන දත්ත පිළිබඳ කටයුතු කොටස් තුනකට බෙදා වෙන්කළ හැකි ය.

1. දෙපාර්තමේන්තුව මගින් පවත්වනුලබන සංගණන හා සමීක්ෂණ කිරීම
2. සමහර අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තුළ මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන සංඛ්‍යා ලේඛන ශාඛා මගින් පවත්වන්නට යෙදෙන සංගණන හා සමීක්ෂණ පැවැත්වීම
3. දෙපාර්තමේන්තුව මගින් මෙන්ම දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාල මගිනුත් මෙරටට සමාජ ආර්ථික තත්ත්වයන් පිළිබඳ දත්ත එක්රැස් කිරීම සම්බන්ධයෙන් කරන්නට යෙදුණු සංඛ්‍යානමය කටයුතු කිරීම.

මේ යටතේ මේ වසරේදී මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබන දීපව්‍යාප්ත වූ විශාලතම සමීක්ෂණ ජන හා නිවාස සංගණනය වශයෙන් සඳහන් කළ යුතුව ඇත. ඊට අමතරව මෙම දෙපාර්තමේන්තුව මගින් එහි ඇති අංශ මගින් පසුගිය කාලයේ සිදු කරන ලද සමීක්ෂණ කිපයක් මෙසේ සඳහන් කළ හැකි ය.

1. රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 1998
2. ශ්‍රී ලංකාවේ ශ්‍රමබල පිළිබඳ සමීක්ෂණය 1999
3. සාමාන්‍ය වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා වූ අර්ධ වාර්ෂික සමීක්ෂණය
4. ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය
5. වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය



සංගණන අංශයේ පරිගණක වලින් අවශ්‍ය ලිපි ලේඛන සැලසුම් කිරීම



සංගණන අංශය විසින් ඊට අදාළ ලිපි ලේඛන හා පොත්පත් තෝරා ඒවා අදාළ අයට යැවීම සඳහා සැලසුම් කරන අයුරු

6. කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය

7. ඉදිකිරීම් කර්මාන්ත පිළිබඳ සමීක්ෂණය

8. ගොඩනැගිලි ද්‍රව්‍ය හා ඉදිකිරීම් තිමැවුම් සමීක්ෂණය

9. කාර්මික නොවන ආර්ථික කටයුතු පිළිබඳ සමීක්ෂණය

10. හස්ත කර්මාන්ත ශිල්පය පිළිබඳ සමීක්ෂණය

11. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය

12. පුරා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය 2000

මීට අමතරව ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අයත් ශාඛා කාර්යාල මගින් වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවල පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ ද ඇත. ඒවා කිපයක් මෙසේ ය.

සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණය

**කම්කරු** දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය මගින් 1971 පටන් තැපැල් මාර්ගිකව මෙම සමීක්ෂණය පවත්වයි. එවැනි සමීක්ෂණ අතර පාසල් සංගණනය, සාමාන්‍ය ඉපැයීම් හා වැඩ කරන කාලය පිළිබඳ සමීක්ෂණය ද දැක්විය හැකි ය. කොළඹ පාරිභෝගික මිල දර්ශකය සාදනු ලබන්නේ ද මෙම දෙපාර්තමේන්තුව විසිනි.

අධ්‍යක්ෂ ජනරාල්වරයකු හා අධ්‍යක්ෂවරුන් සත් දෙනෙකුගෙන් ද අතිරේක අධ්‍යක්ෂ (අධිසේවක) එක් අයකු ද නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරියන් 19 කින් ද ගණකාධිකාරිවරු 2 ක් ද හා පරිපාලන නිලධාරිවරයකුගෙන් ද සමන්විත වූ මෙම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනඥයින් 80 ක් ද සංඛ්‍යා ලේඛන නිලධාරීන් 118 ක් ද සංඛ්‍යා ලේඛන විමර්ශකයින් 510 කින් ද පුස්තකාලයාධිපතිවරයකු ද, වැඩ සටහන් සම්පාදක, මුද්‍රණ කළමනාකරු, පරිගණක මෙහෙයුම් සහය සහායක, යතුරු ලේඛක ආදී විවිධ ශ්‍රේණිවල සිටින සියළුම නිලධාරි හා සේවක සංඛ්‍යාව 1555 ක් ලෙසින් ක්‍රි. ව. 2000 දී නිකුත් කරන ලද 1999 සඳහා වූ පාලන වාර්තාවේ සඳහන් වී ඇත.

මෙම දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යයන්ම අංශ 18 ක් යටතේ ක්‍රියාත්මක වේ. එම අංශ මෙසේ ය.

1. ප්‍රජා විද්‍යාත්මක හා සමාජ සංඛ්‍යා
2. කර්මාන්ත හා ඉදිකිරීම්
3. කෘෂිකර්ම
4. ජාතික ගිනුම්
5. ප්‍රකාශන
6. පුස්තකාලය
7. විත්ත සැකසුම් කටයුතු
8. පරිපාලන
9. තියැදි සමීක්ෂණ
10. මුද්‍රණ
11. ක්ෂේත්‍ර මෙහෙයුම්
12. සංඛ්‍යාත පුහුණු
13. සංඛ්‍යාත සම්බන්ධීකරණ හා ප්‍රමිති
14. සංගණන (ජන හා නිවාස සංගණනය මෙහෙයවයි)
15 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන
16. මිල හා වැටුප්
17. වෙළඳ හා සේවා
18. සිතියම් විද්‍යා අංශය

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය මෙසේ ය.

තැ. පෙ. 563,,කොළඹ 7.

මේ අතර මෙම දෙපාර්තමේන්තුව සතුව අධි ශ්‍රේණියේ පුස්තකාලයක් ද පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල සේවා මණ්ඩල ප්‍රමිතීන්ට අනුව මෙම පුස්තකාලය එසේ වර්ග කර ඇත්තේ මෙම පුස්තකාලයේ සේවා පහසුකම් මෙන් ම එයින් ජාතික හා අන්තර්ජාතික වශයෙන් ද ලබා දෙනු ලබන සේවාවන් පිළිබඳ ඉතා විශිෂ්ට සේවාවක් ඉටු කරනු ලබන නිසා ය. මෙම පුස්තකාලයේ විවිධ රටවල් 225 පමණ සංඛ්‍යා ලේඛන වලට අදාළ වූ විවිධ ප්‍රකාශන හුවමාරු කිරීමේ ව්‍යාපෘතියක් ද ආරම්භ කර ඇති බව එහි ප්‍රධාන පුස්තකාලයාධිපති එම්. බී. එම්. ෆයිරූස් මහතා ප්‍රකාශ කළේ ය. ඊට අමතරව මෙම තොරතුරු ලබා ගැනීම සඳහා අන්තර්ජාල පහසුකම් ද විද්‍යුත් තැපැල් පහසුකම් ද සලසා ඇතැයි දැන ගන්නට ලැබුණි.

දත්ත භාවිතා කරන්නන්ට වඩාත් පහසුවෙන් දැන ගැනීමට හැකිවන පරිදි ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව තොරතුරු මධ්‍යස්ථානයක් ද ඇති කර තිබේ. එහි විද්‍යුත් තැපැල් පහසුකම් ද සලසා ඇත. අන්තර්ජාලය හරහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට වෙබ් අඩවියක් ද දෙපාර්තමේන්තුව මගින් පිහිටුවා ඇත. විද්‍යුත් තැපැල් ලිපිනය -dcensus lanka -ccomk

වෙබ් අඩවි ලිපිනයw.w.w. statistics .Gov.lk

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන ඉතා පහසු මිලට ලබා ගැනීමේ පහසුකම් ද සලසා ඇත. ඒ අනුව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ලිපිනයෙහි පුස්තකාලය ද ප්‍රකාශන අලෙවි සල ද පිහිටුවා ඇත. එම ලිපිනය මෙසේ ය.

**ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු පුස්තකාලය,**

**අංක 231,ගාලුපාර, බම්බලපිටිය**

((එම පුස්තකාලය ගාලුපාරේ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය ඉදිරිපිට පිහිටුවා ඇත.)

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ මෙම ශාඛා කාර්යාල හා අංශය ට අමතරව අමාත්‍යංශ හා විවිධ දෙපාර්තමේන්තුවල ද සංඛ්‍යා ලේඛන අංශ පිහිටුවා ඇත. එවැනි ශාඛා කාර්යාල 46 කි. එම අංශවල සේවය කරන සංඛ්‍යාත කාර්ය මණ්ඩලය

## සංගණන ගැන ඇසෙන කතා

**1940 දී ඇමරිකා එක්සත් ජනපදයේ පවත්වපු ජන සංගණනයේදි හිටිහැටියේ වයස හැටපහේ අයගේ ගණන අසාමාන්‍ය ලෙස ඉහළ ගිහිං. එහෙම වුණේ සමාජ සංරක්ෂණ පනත් පැනවීමෙන් පස්සේ පවත්ව පළමු සංගණනය එයවීම හින්දලු. ඒකේ විදිහට පුරවැසි සුබ සාධක දීමනාව ලබා ගන්න නම් වයස අවුරුදු හැටපහට වැඩිවෙන්න ඕනෑලු. හැට පහේ කට්ටිය වැඩිවෙලා තියෙන්නෙ අපිට දැන ගන්න ලැබුණු විදිහට නං ඔන්න ඔය කාරණේ හින්දයි**

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ පාලන යටතේ සේවය කරනු ඇත. මීට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කොට දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාල 25 ක් ද පිහිටුවා ඇත. මහවැලි සංවර්ධන බල ප්‍රදේශවලට අයත් මහවැලි එච්. කලාපයට අයත් ගල්නෑව ප්‍රදේශයේ එක් කාර්යාලයක් පිහිටුවා ඇත. තවද පළාත් සභාවල ද සංඛ්‍යා ලේඛන කාර්ය මණ්ඩල පිහිටුවා ඇත.

නූතන දියුණු තාක්ෂණයත් සමග අද ලෝකයේ සංඛ්‍යා ලේඛන විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් වෙමින් පවතී. මේ නිසා ලෝකයේ දියුණු රටවල සංඛ්‍යා ලේඛන විෂයට අදාල වන පුහුණු කටයුතු වලට ලංකාවේ සංඛ්‍යා ලේඛන ක්ෂෙත්‍රයේ නියැලෙන නිලධාරීන් පුහුණු කිරීමේ අවශ්‍යතාව හඳුනා ගත් වත්මන් අධ්‍යක්ෂ ජනරාල් විමල් නානායක්කාර මහතා විසින් ඔවුන් පුහුණු කිරීමේ කාර්යය ඉතා මැනවින් ඉටු කිරිමෙහිලා පුරෝගාමී වී ඇති බව සඳහන් කල යුතුව ඇත. ඒ අනුව 1999 වර්ෂය තුළදී පමණක් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විදේශීය රටවල සම්මන්ත්‍රණ සම්මේලන හා වැඩමුළුවලට සහභාගී වීම ඉතාමත් ඉහළ මට්ටමක තිබූ බව එම තොරතුරු පරීක්ෂා කිරීමේදී දක්නට ඇත. මේ සඳහා විදේශීය ජාත්‍යන්තර ආයතන වන එස්කැෆ්, ජයිකා, එස් අයි ඒ ඒ, ලෝක බැංකුව වැනි ආයතන වලින් ද, ඉන්දියාව, තායිලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය, සිංගප්පූරුව ජපානය වැනි රටවල ද මේ සඳහා පුහුණු හා සම්මේලන වැඩ සටහන් වලට නිලධාරීනට සහභාගී වීමට අවස්ථා ලැබී ඇත.

මේ අනුව විමසා බලන විට මෙම දෙපාර්තමේන්තුව ලංකාවේ ආර්ථික සමාජ සංවර්ධනය කෙරෙහි සුවිශේෂ සේවාවක් ඉටු කිරීමේ කාර්ය භාරයෙහි නියැලී සිටින ජාතික ආයතනයක් පමණක් නොව එම තොරතුරු විදේශීය රටවල් හා බෙද හද ගැනීමේ ආයතනයක් ලෙසින් ද සඳහන් විය යුතුව ඇත.

මෙම සංගණන හා දෙපාර්තමේන්තුව පිළිබඳ තොරතුරු ලබාගැනීමේ දී ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විමල් නානායක්කාර මහතා විසින් දක්වන ලද අනුග්‍රහය මෙහිදී කෘතඥ පූර්වකව සඳහන් කල යුතුව ඇත. ඊට අමතරව ජන හා නිවාස සංගණනය පිළිබඳ ප්‍රචාරක කටයුතු භාර නියෝජ්‍ය අධ්‍යක්ෂිකා පද්මිණී ද සිල්වා, සංඛ්‍යා ලේඛනඥ දිසානායක, ප්‍රධාන පුස්තකාලයාධිපති එම්.එම්. බී. එම්. ෆයිරුස් හා සංඛ්‍යා ලේඛන නිලධාරී ලාල් යන මහත්ම මහත්මීන් විසින් මීට අදල තොරතුරු ලබා ගැනීමට දුන් සහාය ද තුති පූර්වකව සඳහන් කල යුතුව ඇත. තවද සංඛ්‍යා ලේඛන විමර්ෂකවරුන් විසින් පල කරනු ලබන පත්‍රිකාවෙන් ද තොරතුරු ලබා ගැනීමට අවස්ථාවක් ලැබීම ද අගයකොට සලකනු ලැබේ.

මේ අනුව විමසා බලන විට මෙම දෙපාර්තමේන්තුව ලංකාවේ ආර්ථික සමාජ සංවර්ධනය කෙරෙහි සුවිශේෂ සේවාවක් ඉටු කිරීමේ කාර්ය භාරයෙහි නියැලි සිටින ජාතික ආයතනයක් පමණක් නොව එම තොරතුරු විදේශීය රටවල් හා බෙද හදගැනීමේ ආයතනයක් ලෙසින් ද හැඳින්විය යුතු ව ඇත.

මෙම සංගණන හා දෙපාර්තමේන්තුව පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අප වෙත දක්වන ලද අනුග්‍රහය මෙහිදි කෘතඥ පූර්වකව සඳහන් කල යුතුව ඇත. ඊට අමතරව ජන හා නිවාස සංගණනය පිළිබඳ ප්‍රචාරක කටයුතු භාර නියෝජ්‍ය අධ්‍යක්ෂිකා පද්මිණී ද සිල්වා, සංඛ්‍යා ලේඛනඥ ධර්මා දිසානායක, සංඛ්‍යා ලේඛන නිලධාරි ඒකනායක ප්‍රධාන පුස්තකාලයාධිපති එම්. බී. එම්. ෆයිරුස් හා සංඛ්‍යා ලේඛන නිලධාරි ලාල් යන මහත්ම මහත්මීහු විසින් මීට අදල තොරතුරු ලබා ගැනීමට දුන් සහාය ද තුති පූර්වකව සඳහන් කල යුතුව ඇත. තව ද සංඛ්‍යා ලේඛන විමර්ෂකවරුන් විසින් පල කරනු ලබන පත්‍රිකාවේන් ද තොරතුරු ලබා ගැනීමට අවස්ථාවක් ලැබීම ද අගය කොට සලකනු ලැබේ.

**තොරතුරු සංඛ්‍යා ලේඛන විමර්ශකවරුන්ගේ පත්‍රිකාවෙනි**

❑